128

පරිපාලන නියෝග 04/ 2017

මගේ අංකය: පා/1/2/5/1
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.04. 02

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු),
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලුම කෘෂිකර්ම විද්‍යාල
සහ පුහුණු ආයතන වල ඒකක ප්‍රධානීන්,

**<u>ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලවල සිසුන්ට ශාරීරික / මානසික වධ හිංසා පැමිණවීම වැළැක්වීම.</u>**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාල වලට ඇතුලත් කර ගන්නා නවක සිසු සිසුවියන් හට ශාරීරික / මානසික වධ හිංසා පැමිණවීම වළකාලීමේ අරමුණින් මෙම පරිපාලන නියෝගය නිකුත් කරනු ලැබේ. මෙහි සඳහන් විධි විධාන සම්බන්ධයෙන් කෘෂිකර්ම විද්‍යාල සිසුන් ඇතුළු අදාල සියළු පාර්ශවයන් දැනුවත් කිරීම අපේක්ෂා කෙරේ.

1. කෘෂිකර්ම විද්‍යාල වලට සිසුන් ඇතුලත් කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන කාල සීමාව සියළුම කෘෂිකර්ම විද්‍යාල වල සිසුනට පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තු භූමිය තහනම් ප්‍රදේශයක් වේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයන් විදුහල්පති වරුන්ට වාර්තා කරනු ලබන අතර මෙම තහනම් නියෝගය විදුහල්පතිවරුන් විසින් අදාළ සිසුනට දැන්විය යුතුය.

2. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති සියළුම කෘෂිකර්ම විද්‍යාල වල සහ පුහුණු ආයතන වල පුහුණුව සඳහා පැමිණෙන සිසුනට හා බාහිර කිසිම කෙනෙකුට මොනම ආකාරයක හෝ ශාරීරික හෝ මානසික පීඩාවක් පැමිණවීම සම්පූර්ණයෙන් තහනම් වේ. නවක වධයක් සිදුවන්නේ යැයි ප්‍රදර්ශනය වන ආකාරයට හැසිරීම හෝ කටයුතු කිරීම හා නවක සිසුන්ට මානසික පීඩා ඇති කිරීම ඔවුන්ගේ ගමන් බිමන් ආදිය හැසිරවීම, ඇඳුම් ඉවත් කිරීම ආදිය හා වෙනත් කටයුතු මගින් සීමා පැමිණවීම සපුරා තහනම් වේ.

3. නවක සිසුන් විද්‍යාල වලට වාර්තා කළ පසු ඔවුනට නවක වධය යයි කියා ගනු ලබන අමානුෂික ක්‍රියාවලියෙහි ඇති නිරර්ථක භාවය පිලිබඳවත් , එවැනි වධ බන්ධන වලට එරෙහි වීමට සිසුන්ට ඇති අයිතීන් පහදා දී ඔවුන් විදුහල් පරිසරයට හා කාර්ය මණ්ඩලයට හුරු කළ යුතුවේ. එසේම තමන්ට යම් ආකාරයක වධයක් පමුණුවන්නේ නම් ඒ බව නිර්නාමිකව හෝ වාර්තා කරන ලෙස ද දැන්විය යුතුවේ. නවක සිසුන් පිළිගැනීමේ මෙම සමාරම්භක රැස්වීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් , අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු), අධ්‍යක්ෂ (පාලන) හා කෘෂිකර්ම විද්‍යාලවල විදුහල්පතිවරයා හා ආචාර්ය මණ්ඩලය ද සහභාගී වීම වඩාත් උචිත වේ. එමෙන්ම විද්‍යාල කිහිපයක් ඇති බැවින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අන් උසස් නිළධාරීන් ද ඒ ඒ විද්‍යාල වල එකම දිනයක පැවැත්වෙන සමාරම්භක රැස්වීම් වලට සහභාගී වීම සඳහා යොදාගත යුතුවේ.

4. නවක සිසුන් කෘෂිකර්ම විද්‍යාලයේ ලියාපදිංචි වී දින 03 ක් ඇතුලත හඳුනා ගැනීමේ අංකයක් ඔවුන් හට නිකුත් කළ යුතුවේ. අවශ්‍ය අවස්ථා වලදී ජ්‍යෙෂ්ඨ සිසුන්ට ඔවුන්ගේ හැඳුනුම්පත් පැළඳ සිටීම හා නවක සිසුන්ට ඔවුන්ගේ හඳුනා ගැනීමේ අංක පැළඳ සිටීම අනිවාර්ය කිරීමට විදුහල්පතිට බලය ඇත. එවැනි අවස්ථා වල දී තම හැඳුනුම්පත හෝ අංකය පැළඳ නොසිටීම විනය විරෝධී වන අතර විදුහල්පතිවරුන් විසින් එවැනි සිසුන්ට දඩුවම් නියම කරනු ඇත. ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අංක හා ඡායාරූප සහිත නාම ලේඛනයක් නවක සිසුන්

ඇතුළත් කර ගත් අවස්ථාවන් හී දී හෝ අවශ්‍ය වෙනත් අවස්ථා වලදී විදුහල්පතිවරුන් විසින් දැන්වීම් පුවරු වල ප්‍රදර්ශනය සඳහා තැබීමට කටයුතු කළ යුතුය.

5. විදුහල්පතිවරයා විසින් නවක වධ සිද්ධීන් අනාවරණය කර ගැනීම සඳහා සෝදිසි කමිටු පත් කළ යුතු අතර මෙම කමිටු දිවා රාත්‍රී ක්‍රියාත්මක විය යුතුවේ.

6. විදුහල්පතිවරයා විසින් නේවාසිකාගාර භාරකරුගේ හා තම කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව රාත්‍රී කාලයේ සෝදිසි පරීක්ෂණ පැවැත්විය යුතුවේ.

7. නවක වධ සිද්ධීන් ආනාවරණය වූ විට හෝ දැන ගැනීමට ලැබුණු විට එය වාර්තා කිරීම සෑම සේවකයෙකුගේ / නිළධාරියෙකුගේ ම වගකීමක් වේ. නවක වධ සිද්ධීන් සංවිධානය කිරීම, මෙහෙයවීම හා සිදුවීම දැන දැනත් වාර්තා නොකර සිටීම සේවකයෙකුගේ / නිළධාරියෙකුගේ අතින් සිදුවන විනය කඩ කිරීමක් ලෙස සළකා ක්‍රියා කිරීමට විදුහල්පතිට බලය ඇත.

8. නේවාසිකාගාර භාරකරු හා මුරකරුවන් වෙත මේ පිළිබඳව විශේෂ වගකීමක් පැවරෙන අතර මොනම අවස්ථාවකදී හෝ යම් අසාමාන්‍ය සැක කටයුතු සිද්ධියක් පිළිබඳව දැන ගැනීමට ලැබුන වහාම මුර සේවකයන් විසින් ඒ බව විදුහල්පතිවරයාට හෝ වෙනත් නිළධාරියෙකුට වාර්තා කළ යුතුවේ. මෙම අයට නවක වධය වැළැක්වීමට අදාළව රාජකාරි කටයුතු පැවරීමේ ලිපියක් විදුහල්පතිවරයාගේ අත්සනින් නිකුත් කර තිබිය යුතුය.

9. නවක සිසුන් ඇතුලත් වී මාස 03 ක් යනතුරු ජ්‍යෙෂ්ඨ සිසුන්ට නවක සිසුන්ගේ නේවාසිකාගාර තහනම් ප්‍රදේශයක් වන අතර නවක සිසුන් ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ නේවාසිකාගාර වෙත කැඳවාගෙන යාම ද තහනම් වේ. එකම නේවාසිකාගාරයක ජ්‍යෙෂ්ඨ සහ නවක සිසුන් ලැගුම් ගනී නම් නවක සිසුන්ගේ කාමර හෝ නිදන ශාලා තුලට ජ්‍යෙෂ්ඨ සිසුන්ට ඇතුලත්වීමටත් ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ නිදන ශාලා වලට හා කාමර වලට නවක සිසුන් කැඳවාගෙන යාමත් තහනම් වේ. සිසුන් ආහාර ගන්නා කාලය තුළ භෝජනාගාරයේ රැඳී සිට එහි කටයුතු ගැන පරීක්ෂා කිරීම නේවාසිකාගාර නිළධාරීන්ගේ වගකීම වනු ඇත.

10. නවක සිසුන් විදුහලට බඳවා ගන්නා වකවානුව තුළ ආදි සිසුනට විදුහල්පතිගේ පූර්ව අවසරය නොමැතිව විදුහලට ඇතුළුවීම තහනම් වේ. යම් අවශ්‍යතාවයක් සඳහා විදුහල්පතිගේ කාර්යාලය වෙත පැමිණීමට මෙයින් බාධාවක් නොවිය යුතුය. විදුහල්පතිගේ පූර්ව අවසරයක් රහිතව ආදි සිසුනට විද්‍යාලයේ සිසුන් හමුවීම තහනම් වේ.

11. දෙමව්පියන්ට හා භාරකරුවන්ට සිසුන් මුණ ගැසීමට පෙර විදුහල්පතිවරයාගේ හෝ නේවාසිකාගාර භාරකරුගේ අවසරය ලබා ගත යුතු අතර ඔවුන් මුණ ගැසිය යුත්තේ නේවාසිකාගාරයේ පොදු ශාලාවේදීය. (කාල නියමයක් ඇතිව) මොනම හේතුවක් නිසා හෝ ආදි සිසුනට හා කිසිම බාහිර පුද්ගලයෙකුට නේවාසිකාගාරයේ රාත්‍රී ගත කිරීමට අවසර නොදිය යුතුය.

12. විදුහල් භූමිය පාලනය කර ගැනීම විදුහල්පතිගේ වගකීමක් වන අතර පොලිසිය කැඳවිය යුත්තේ සාමය කඩවීමක් හෝ පාලනය කර ගත නොහැකි කලබලකාරි අවස්ථාවකදී, අපරාධයක් සිදුවීමට යන්නේ යැයි සිතන අවස්ථාවකදී හෝ අපරාධක් සිදුවී ඇතැයි පෙනී යන අවස්ථා වලදී පමණි. එහෙත් පොලිසිය මගින් සිරිත් පරිදි කරනු ලබන සංචාරක මුර සේවයට මෙය බාධාවක් නොවිය යුතුය.

13. මොනම ආකාරයක හෝ ශාරීරික / මානසික වධයකට නවක සිසුන් ලක් කිරීම දඬුවම් ලැබිය යුතු වරදක් බව විදුහල්පති විසින් මවුපියන්ට / භාරකරුවන්ට නවක සිසුන් ඉදිරියේදී පළමු දින රැස්වීමේදී දැනුම් දිය යුතු අතර තම දරුවාට යම් අපරාධයක් සිදුවන බවට දැන ගැනීමට ලැබුණහොත් විදුහල්පති හෝ වග කිවයුතු නිළධාරියෙකු වෙත නොපමාව වාර්තා කරන ලෙස ද දැනුම් දිය යුතුය.

14. නවක වධ සිද්ධි පිළිබඳව දැන ගැනීමට ලැබුණු වහාම විදුහල්පති විසින් තමාට සුදුසු යැයි හැඟී යන ආකාරයක පරීක්ෂණයක් විනය කමිටුවක් මගින් පවත්වා එය වැළැක්වීමට හෝ තමාට බලය පවරා ඇති සීමාව තුළ දඬුවම් පැමිණවීමට ක්‍රියා කළ යුතු අතර මෙම සිද්ධි පිළිබඳව අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) මගින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කළ යුතුය. එසේ පවත්වන ලද විනය කමිටුවක නිගමන පිළිබඳව මොනම හේතුවක් නිසා හෝ සිසුන්ට අභියෝග කළ නොහැක. එහෙත් අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) මගින් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක.

15. විදුහල්පති විසින් නවක සිසුන් ඇතුලත් වී පළමු මාස 02 තුළ නවක වධ සිද්ධීන් පිළිබඳ සතිපතා අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) වෙත වාර්තා කළ යුතු අතර ඊළග මාසයේදී සති 02 කට වරක් වාර්තා කළ යුතු වේ. නවක වධ සිද්ධීන් මෙම කලය තුළ සිදු නොවූයේ නම් ඒ බව ද ඉහත සඳහන් පරිදි සතිපතා හා පසුව සති 02 කට වරක් වාර්තා කළ යුතු වේ.

16. විදුහල් තුළ සිදු වන විනය විරෝධී ක්‍රියා සම්බන්ධ පහත සඳහන් දඬුවම් පැමිණවීමට විදුහල්පති වෙත බලය පැවරේ.

- අ. අවවාද කොට දෙමාපියන් / භාරකරුවන් වෙත වාර්තා කිරීම.
- ආ. අවවාද / කරවටු කර ලිපියක් පුද්ගලික ගොනුවේ ගොනු කිරීම.
- ඇ. සති 02 කාලයක් දක්වා පන්ති තහනම් කිරීම.
- ඈ. ශිෂ්‍යාත්වලාභියෙක් නම් ඔහු /ඇය අයත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට දැනුම් දීම.
- ඉ. වරකට රු. 1000.00 දක්වා වූ දඩයක් නියම කිරීම.

17. උක්ත දඬුවම් වලට අමතරව, විනය විරෝධී ක්‍රියාවේ බරපතලකම සළකා බලා, අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු) ගේ නිර්දේශ මත සති 02 සිට මාස 02 දක්වා වූ කාල සීමාවකට පන්ති තහනමක් පැනවීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියා කරනු ලැබේ.

18. බරපතල සිද්ධීන් පිළිබඳව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා වූ පසු පහත සඳහන් ඕනෑම ආකාරයකට කටයුතු කර, දඬුවම් පැමිණවීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් ක්‍රියා කරනු ලැබේ.

- අ. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසු යැයි හැඟෙන ආකාරයකට පරීක්ෂණයක් පවත්වා ශිෂ්‍ය භාවය අහෝසි කිරීම හෝ වෙනත් ආකාරයක දඬුවමක් පැමිණවීම.
- ආ. විදුහල්පතිගේ වාර්තාව සහ අධ්‍යක්ෂ (ව්‍යාප්ති හා පුහුණු)ගේ නිර්දේශ පදනම් කරගෙන මාස 06 ක කාලයකට පන්ති තහනම් කිරීම.
- ඇ. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි සුදුසු යැයි හැඟෙන වෙනත් දඬුවමක් පැනවීම.

19. නවක වධයක ස්වරූපයක් ගනු ලබන මොනයම් හෝ ක්‍රියාවක් පිළිගැනීම හා එය කරනු ලැබීමට කැමැත්තෙන් ඉදිරිපත් වීම සහ එම ක්‍රියාවන්ට භාජනය වීම නවක වධයට අනුබල දීමක් සේ සළකා නිසි පරිදි විනයානුකූලව කටයුතු කිරීමට විදුහල්පති කටයුතු කළ යුතුය.

20. කෘෂිකර්ම විද්‍යාලයන්හි සහ පුහුණු ආයතනයන්හි විනය පාලන කටයුතු පිළිබඳව කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

21. කෘෂිකර්ම විද්‍යාලයන්හි ඩිප්ලෝමා පාඨමාලාවට තෝරාගනු ලබන සෑම ශිෂ්‍ය / ශිෂ්‍යාවක්ම මේ සමඟ අමුණා ඇති "අ" උප ලේඛනයේ සඳහන් කොන්දේසි මාලාව පිළිගත් බවට සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරිපිට දී පිටපත් දෙකකින් අත්සන් කර භාර දිය යුතු අතර එක් පිටපතක් ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවේ ගොනු කළ යුතුවේ. ඉතිරි පිටපත ශිෂ්‍යාගේ දැනගැනීම සඳහා ඔහුට / ඇයට භාර දිය යුතුය.

22. මගේ අංක ප/6/2/5/2 හා 2009.01.26 දිනැති අංක 03/2009 දරණ පරිපාලන නියෝගය මෙයින් අවලංගු කරනු ලබන අතර, මෙම පරිපාලන නියෝගය 2017.04.01 දින සිට බල පැවැත්වෙන බව වැඩි දුරටත් දන්වමි.

23. ඉහත අංක 01 සිට 21 දක්වා වූ විධිවිධාන වලට අමතරව 1998 අංක 20 දරණ අධ්‍යාපන ආයතන වල නවක වධය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත මගින් සලසා ඇති විධිවිධාන කිසිවක් උල්ලංඝනය නොකළ යුතු බව ද අවධාරණය කෙරේ.

ආචාර්ය, ආර්.ආර්.ඒ. විජේකෝන්.
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :

සියළුම අධ්‍යක්ෂවරුන් /ප්‍රධාන ඉංජිනේරු /ප්‍රධාන ගණකාධිකාරී,
ප්‍රධාන අභ්‍යන්තර විගණක/
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම(
} කාරුණික දැනගැනීම පිණිස.